කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON- E 2015

සූක්ෂ්ම ආර්ථික විද්‍යාව

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. යථානුරූපී හා අභිමතානුරූපී විද්‍යාවක් වශයෙන් ආර්ථික විද්‍යාවේ ස්වභාවය විස්තර කරන්න. එය සමාජීය විද්‍යාවක්ද?

02. i. හීනවන ආන්තික උපයෝගීතා නීතිය විස්තර කර එහි වැදගත්කම හා සීමාවන් විස්තර කරන්න.

ii. පරිභෝජක හැසිරීම පිළිබඳ ආන්තික උපයෝගීතා න්‍යාය සහ උපේක්ෂා වක්‍ර විග්‍රහය සසඳන්න. සංකල්පමය වශයෙන් මේ න්‍යාය දෙකෙන් වඩා හොඳ වන්නේ කුමක්ද?

03. i. ''හීනවන ආන්තික ඵලදා නීතිය'' යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක් ද? මේ නීතිය අනුව කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයේ හැසිරීම ප්‍රස්ථාරගත කොට විස්තර කරන්න.

ii. ''කෙටි කාලයේදී නිෂ්පාදන තීරණවලට එළඹෙන්නේ II වන නිෂ්පාදන අවධියේදී පමණි.'' ඉහත i කොටසේදී ගොඩනංවන ලද ප්‍රස්ථාරය මත කෙටිකාලීන නිෂ්පාදන අවධි දක්වා මේ ප්‍රකාශය විමසන්න.

04. i. 'සමනිෂ්පාදිත වක්‍රය' අර්ථ දක්වා ඒවායේ ගතිලක්ෂණ සහ නිෂ්පාදන න්‍යායේදී ඒවායේ වැදගත්කම පෙන්වන්න.

ii. සමනිෂ්පාදිත වක්‍ර විග්‍රහය යටතේ පිරිවැය සංරෝධකයකට යටත්ව නිමැවුම උපරිම කිරීම සඳහා වූ කොන්දේසි ප්‍රස්ථාරිකව හෝ ගණිතමය සමීකරණ භාවිතයෙන් ව්‍යුත්පන්න කරන්න.

iii. 'පරිමාණානුකූල ඵල පිළිබඳ නීති' යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්ද? සමනිෂ්පාදිත වක්‍ර සිතියම් භාවිතයෙන් ඒවා විස්තර කරන්න.

05. i. පූර්ණ තරඟය යටතේ ආයතනයේ හා කර්මාන්තයේ දිගුකාලීන සමතුලිත කොන්දේසි රූපසටහන් මගින් දක්වා විස්තර කරන්න.

ii. පූර්ණ තරඟය යටතේ සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් උපයෝජනය වන ආකාරය විස්තර කරන්න.

06. i. 'ඒකාධිකාරය' යන සංකල්පය සාකච්ඡා කරන්න. ආයතනයක ඒකාධිකාරී බලය නිශ්චය කරන ප්‍රධාන සාධක මොනවාද?

ii. මිල විශ්ලේෂණය යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්ද? ඒකාධිකාරී ආයතනයකට තම ගනුදෙනුකරුවන්ගෙන් එකිනෙකට වෙනස් මිල අය කළ හැක්කේ කෙසේ ද? ප්‍රස්ථාර භාවිතයෙන් විස්තර කරන්න.

07. i. ඒකාධිකාරී තරඟය යටතේ දැකිය හැකි නිර්මිල තරඟය සාකච්ඡා කරන්න.

ii. ඒකාධිකාරී තරඟය යටතේ ආයතනයේ හා කර්මාන්තයේ දිගුකාලීන සමතුලිතය ප්‍රස්ථාරිකව නිරූපනය කර විස්තර කරන්න.

08. පහත දැක්වෙන සංකල්ප කෙටියෙන් විස්තර කරන්න.

i. ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක
ii. වැටි රේඛා
iii. ප්‍රසාරණ පථය
iv. ආර්ථික බද්ධකුලිය
v. ව්‍යාවර්තිත ඉල්ලුම් වක්‍රය

*********************************